# දෙසතිය

පුවත් සඟරාව

2020 මාර්තු 01 - 14




## ඩිජිටල් අවකාශයෙන් සුහුරු හෙටක්

# දෙසතිය

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව,
163, කිරුළපන ඇවනිව්,
පොල්හේන්ගොඩ, කොළඹ 05.

සංස්කාරක මණ්ඩලය
දු. අ. 011 - 2513757 / 0112 - 513153
විද්‍යුත් තැපෑල - desathiya@gmail.com
බෙදාහැරීමේ අංශය
දු. අ. 011 - 2515759/ දිගුව - 232

වෙළුම 43, කලාපය 05,
2020 මාර්තු 01 - 14



**උපදේශක සංස්කාරක**
නාලක කලුවැව
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්

**අධීක්ෂණ සංස්කාරක**
තිලකරත්න ලියනපටබැඳි

**සංස්කාරක**
මාලා මල්කාන්ති පරණගමගේ

**සහය සංස්කාරක**
මල්ෂි පවිත්‍රා දික්කුඹුර

**ඡායාරූප සංස්කරණය**
**රූ රටා සහ කවර නිර්මාණය**
සංජීව පෙත්තාවඩු

**විශේෂාංග ලේඛකයෝ**
ආනන්ද ජයසිංහ
ඩොනල්ඩ් සේනාධීර
ශ්‍යාමා සන්ධ්‍යානායකගේ
කාංචනා සිරිවර්ධන
මනෝජා සමරනායක

**ප්‍රවෘත්ති නිලධාරී**
නිල්මිණි ප්‍රනාන්දු

**කළමනාකරණ සහාය**
චන්ද්‍රිකා ගුණසේකර

**ඡායාරූප ශිල්පීන්**
සුදත් සිල්වා
ලක්සිරි සුභාෂණ අල්විස්
යමුනි රශ්මිකා
දර්ශන කරුණාරත්න
තුසිත චන්ද්‍රකුමාර
එල්. ඒ. රෝහණ

**ඡායාරූප පුස්තකාලය භාර නිලධාරී**
නිශාන්ත පීරිස්

**බෙදාහැරීමේ කළමනාකරු**
ලාල් සූරියආරච්චි

**මුද්‍රණය**
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

**ප්‍රකාශනය හා බෙදාහැරීම**
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව


# ඩිජිටල් ශ්‍රී ලංකාවක්

දැනුම් කේන්ද්‍රියගත වර්ෂයක කටයුතු කරමින් සිටින අපට තාක්ෂණය මත සියල්ල යැපෙන ආනාගතයකටයි නුදුරේදී මුහුණදීමට සිදුවනු ඇත්තේ. මේ නිසා ම ශ්‍රී ලාංකික ජන ජීවිතය ඉහළට ඔසවා තැබීමට විශාල සමාජ පරිවර්තනයක් සිදු කර තාක්ෂණික නාව්‍යකරණ සංස්කෘතියක් (Culture of Technological Inovation) ගොඩනැඟීමට රජය අපේක්ෂා කරනවා.

මේ වන විටත් තාක්ෂණය සමඟ බැඳුණු ජන ජීවිතයකට හුරු වී සිටින ප්‍රජාවක් සිටින රටක් ලෙස ශ්‍රී ලංකාවට එය කරා ළඟා වීම අභියෝගයක් නොවෙ යි. ශ්‍රී ලංකා මහබැංකු වාර්තාවට අනුව මෙරට සමස්ත දුරකතන ඝනත්වය (පුද්ගලයන් 100කට ඇති සම්බන්ධතා සංඛ්‍යාව) 161.6ක්. අන්තර්ජාල ඝනත්වය 33.5ක්. එය 2017 වසර අවසන් වන විට පැවති 27.5ක අගයට සාපේක්ෂ ව වැඩිවීමක්. මෙමගින් පෙනී යන්නේ ජනතාව තාක්ෂණික සමාජයකට දක්වන නැඹුරුතාවයි.

රටේ ප්‍රමුඛ අවශ්‍යතාවක් ලෙස හඳුනා ගැනෙන රාජ්‍ය සේවාව තුළ මේ වන විට ජනතා සේවා රැසක් ඩිජිටල්කරණය වී ඇති බව අප දන්නා කරුණක්. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය විසින් ක්‍රියාත්මක ලංකා රාජ්‍ය ජාලය 2.0 (Lanka Government Network 2.0) තුළින් මේ වන විට රාජ්‍ය ආයතන 860ක් ඩිජිටල්කරණයෙන් සම්බන්ධ වී තිබෙන බව මහබැංකු වාර්තාව සඳහන් කරනවා. ඉදිරියේ අනෙකුත් රාජ්‍ය ආයතන ද මේ සඳහා ගමන් කරනු ඇති.

මෙහිදී අප හමුවේ ඇති අභියෝගය වන්නේ රාජ්‍ය අංශය තුළ සිදු වන මේ ඩිජිටල් විප්ලවය තුළ සුහුරු වෘත්තිකයකු බවට පත් වීමට අවශ්‍ය ආකල්ප ගොඩනගා ගැනීම යි. සාම්ප්‍රදායික වැඩ පරිසරයක් තුළ කටයුතු කරමින් සිට සුහුරු පරිසරයකට හැඩ ගැසීම ඇතැමකුට ප්‍රිය නොවිය හැකි යි. එහෙත් ඩිජිල්කරණය වන ලෝකයේ ඉන් පළා යාමට කිසිවකුටත් බැහැ. ඩිජිටල්කරණ ක්‍රියාවලිය සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම රජය හමුවේ තිබෙන අභියෝගයක්. කෙසේ වෙතත් එය ද ජයගත නොහැකි අභියෝගයක් නොවෙ යි. මේ නිසා ධනාත්මක ව මේ දෙස බැලීම යි වැදගත්. එවිට තාක්ෂණය පාදක සමාජයක් කරා යන ගමනේදී ඩිජිටල් ශ්‍රී ලංකාවක සිහිනය සැබෑවන දිනය වැඩි ඈතක නොවනු ඇති.

එම්. එම්. පරණගමගේ

- සංස්කාරක -



# ඩිජිටල් අවකාශයෙන් සුහුරු හෙටක්

කවරයේ කතාව - ටී.එම්.ජී. චන්ද්‍රසේකර
tmg@icta.lk

තාක්ෂණය මත පදනම් වන සමාජයක් ගොඩනැගීම වත්මන් රජය හඳුනාගෙන ඇති ප්‍රමුඛ අවශ්‍යතාවක්. මේ පිළිබඳ විශේෂ අවධානයක් යොමු කරමින් රාජ්‍ය ප්‍රතිපත්ති රාමුව වන සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනය මඟින් පෙන්වා දෙන්නේ එහි ඇති කාලීන අවශ්‍යතාව හා උපයෝගීතාව යි. ඒ අනුව දැනුම කේන්ද්‍රීය ශත වර්ෂයක් ලෙස හඳුන්වන 21 වැනි සියවසේ නැගී එන තාක්ෂණය සඳහා උපායමාර්ගික ව ආයෝජන කිරීමටත් අධ්‍යාපන ක්‍රමයට එය එක් කිරීමටත් ආර්ථිකය සමඟ මුසු කිරීමටත් කටයුතු කළ යුතු බව යි අවධාරණය කර පෙන්වන්නේ. එහිදී කෘෂිකර්මය, කර්මාන්ත ක්ෂේත්‍රය, සේවා අංශය අනාගතයේදී තාක්ෂණය මත යැපෙන ආර්ථික අංශ බවට පත් වෙනවා. ඒ අනුව අනාගතයේ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ දැමීම සඳහා විශාල සමාජ පරිවර්තනයක් සිදු කොට තාක්ෂණික නව්‍යකරණ සංස්කෘතියක් (Culture of Technological innovation) ගොඩනැගීම යි රජයේ අරමුණ. මේ නව දැක්ම ක්‍රියාත්මක වන්නේ ජාත්‍යන්තර නව නිපැයුම් කේන්ද්‍රස්ථානයක් (Global Innovation Hub) ජනතා කේන්ද්‍රිය ඩිජිටල් ආණ්ඩු ක්‍රමයක් (Citizen Centric Digital Government) ඩිජිටල්කරණ වූ ලංකාවක් (Digitally Inclusive Sri Lanka) හා තොරතුරු තාක්ෂණ ව්‍යවසායකත්වයක් (IT Entrepreneurship) යන මූලික සංකල්ප පෙරදැරිව යි.

විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් සඳහා ප්‍රවේශය ඉහළ නැංවීමෙන් ආර්ථික සංවර්ධනය වැඩි දියුණු කළ හැකි බව රජය පිළිගෙන තිබෙන කරුණක්. ශ්‍රී ලංකාවේ ජනගහනය මිලියන 20.98ක් වන විට ජංගම දුරකතන සබඳතා සංඛ්‍යාව මිලියන 32.5 දක්වා 15%කින් වැඩි වී තිබෙනවා. අන්තර් ජාල සබඳතා 1,530,099 ක් දක්වා 25.2%කින් වැඩි වී තිබෙනවා. සක්‍රිය ලෙස සමාජ මාධ්‍ය භාවිතා වන ප්‍රමාණය මිලියන 6.20ක්. මේ අතර තොරතුරු සන්නිවේදන

> **විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් සඳහා ප්‍රවේශය ඉහළ නැංවීමෙන් ආර්ථික සංවර්ධන වැඩි දියුණු කළ හැකි බව රජය පිළිගෙන තිබෙන කරුණක්. ශ්‍රී ලංකාවේ ජනගහනය මිලියන 20.98ක් වන විට ජංගම දුරකථන සබඳතා සංඛ්‍යාව මිලියන 32.5ක්.**

ක්ෂේත්‍රයේ වෘත්තීයන්ගේ වර්ධනය ද වසරින් වසර වැඩිවෙමින් පවතිනවා. 2014 දී 82854ක් වූ මේ සේවා බලකාය 2018 වන විට 12,4873ක් වී තිබෙනවා. ICTA ආයතනය සතු සමාජ සමීක්ෂණ අනුව වාර්ෂිකව 2500ක පමණ මේ වෘත්තිකයන්ගේ හිඟයක් තිබෙනවා.

මෙවැනි පසුබිමක රටේ රාජ්‍ය අංශය ඩිජිටල්කරණය ඔස්සේ ශක්තිමත්වීම වැදගත් වන්නේ ජනතා අවශ්‍යතා සපුරන ප්‍රධාන ආයතනික ව්‍යුහයක් ලෙස එය වැදගත් වන නිසා.

## ජනතා කේන්ද්‍රිය ඩිජිටල් ආණ්ඩුක්‍රමයක්

රාජ්‍ය අංශයේ බොහෝ සේවා මේ වන විටත් අන්තර්ජාලය ඔස්සේ ලබා ගැනීමේ හැකියාව පවතිනවා. විශේෂයෙන් බැංකු හා වානිජ ක්ෂේත්‍රයේ මේ කටයුතු ඔන් ලයින් ක්‍රෙඩිට් සේවා මගින් ඉතා සාර්ථක ව භුක්ති විඳීමට යි පාරිභෝගිකයන්ට හැකි වී තිබෙන්නේ. කෙසේ වෙතත් රාජ්‍ය යාන්ත්‍රණයේ පවතින අකාර්යක්ෂමතාව, ප්‍රමාදය, තැනින් තැනට යාමට සිදු වීම ආදිය වළක්වාලමින් සේවාලාභියා සේවා සපයන්නා වෙත යාම වෙනුවට අන්තර්ජාලය ඔස්සේ අදාළ අනුමැතිය හා අවශ්‍ය සේවා සපයන ක්‍රමවේදයක් (Transformation of Public Sector Service Delivery) හඳුන්වා දීම යි ඉදිරි අපේක්ෂාව. එමෙන් ම මේ නව ක්‍රමවේදය ඔස්සේ තාක්ෂණය හා අන්තර්ජාලය භාවිතයෙන් ජනතා කේන්ද්‍රීය සේවා මධ්‍යස්ථාන (Citizen Service Centre) පිහිටුවීමට ද රජය අරමුණු කරන්නේ ජාතික හැඳුනුම්පත්, ගුවන් ගමන් බලපත්‍ර, රජයේ ඉඩම් ඔප්පු ආදී ජනතා සේවා කඩිනමින් හා කාර්යක්ෂම ව සිදු කර ගත හැකි පසුබිම ගොඩනැඟීමට.

මේ සඳහා ප්‍රවේශයක් ලෙස එය වඩාත් අර්ථවත් හා ක්‍රමවත් ව ක්‍රියාවට නැඟීමේ වැඩපිළිවෙළක් ද දැන් ක්‍රියාත්මකයි. ඒ අනුව 2020 ජනවාරි මස 13 වැනි දින ජනාධිපති ලේකම්වරයා විසින් නිකුත් කළ චක්‍ර ලේඛයකින් සඳහන් කර සිටියේ රාජ්‍ය අංශයේ සියලුම අමාත්‍යාංශ හා ආයතන යටතේ ක්‍රියාත්මක වන පොදු ජනතාවට බලපාන සියලු ඩිජිටල් සේවා සහ ව්‍යාපෘති ICTA ආයතනයේ කළමණාකාරිත්වය හා අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක විය යුතු බව යි.

ජනතාව ඩිජිටල් තාක්ෂණයෙන් සවිබල ගැන්වීම සහ ඩිජිටල් ආර්ථිකයකට අවශ්‍ය උපාය මාර්ග ක්‍රියාවලියක අවශ්‍යතාව මූලික කාර්යයන් ලෙස යි ඔවුන් හඳුනාගෙන තිබෙන්නේ. එමෙන් ම ජාතික ආරක්ෂාව, පුරවැසි සේවා, ව්‍යාපාර සේවා, රාජ්‍ය වියදම අවම කිරීම, රාජ්‍ය ආදායම ඉපයීම, රාජ්‍ය සේවයේ විනිවිදභාවය හා වගවීම තහවුරු කිරීම ප්‍රමුඛ අරමුණු ලෙස මෙහිදී හඳුනාගෙන තිබෙනවා. ගෝලීය අනාගත සංවර්ධනය රඳා පවතින්නේ සන්නිවේදනය, සහයෝගිතාව හා නවීකරණය මත බවයි නූතන පිළිගැනීම. එහි සන්නිවේදනයට හිමිවෙන්නේ සුවිශේෂ තැනක්. මිනිසා ගින්දර සොයා ගැනීමේ සිට කෘත්‍රිම බුද්ධිය (Artificial intelligence) දක්වා වර්ධනය වන විට අශ්වයකුගේ වේගය පරදවා චිත්ත වේගයකට සමාන වේගයකින් අවකාශය හරහා ගමන් කිරීමේ හැකියාවක් අද සන්නිවේදන තාක්ෂණය සතු කරගෙන සිටිනවා.

මේ තාක්ෂණික හැකියාව ඩිජිටල් තාක්ෂණය පාදක කර ගනිමින් අපගේ එදිනෙදා කාර්යයන්, අන්තර් ක්‍රියාකාරිත්වයන් වඩාත් පුළුල් කර ගැනීමට හැකිවී තිබෙනවා. මේ සඳහා පාදක වන අන්තර්ජාලය අද ගෝලීය වෙළෙඳපොළක්, වැඩබිමක්, රැස්වීම් ශාලාවක් වී අවසන්.

මේ වෙනස්වීමේ වේගය හා පරිමාණය පාරිභෝගිකයන්ට පරිශීලකයන්ට ඇතුළු සමස්ත පුරවැසියන්ට ද බලපා තිබෙන්නක්. එය රජය හා ප්‍රජාතන්ත්‍රවාදය වඩාත් කාර්යක්ෂම හා අර්ථ ගන්වන්නක් බවට පත්කිරීමට තරම් සවිමත්.

රාජ්‍ය කාර්යක්ෂමතාව, විනිවිදභාවයට පමණක් නොව පුරවැසියා රාජ්‍යයේ සක්‍රීය ප්‍රතිලාභ ලබන්නකු හා ඩිජිටල්



තක්ෂණය නිසා බලපෑම්කරුවකු කිරීමේ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාදාමයකට ඩිජිටල් තාක්ෂණය නිසා යොමු ව සිටිනවා.

## ඩිජිටල් විප්ලවයේ ඇරඹුම

ලෝකයේ ටෙලිග්‍රාප් දුරකතන භාවිත වන මුල් වකවානුවලදීම බ්‍රිතාන්‍යයන් විසින් එය ශ්‍රී ලංකාවේදී ප්‍රයෝජනයට ගනු ලබනවා. අපගේ ගුවන්විදුලිය ආසියාවේ පැරණිතම සේවාවක්. 1950 ගණන්වල ගණකාධිකාරි කටයුතු (ගණන් එකතු කිරීම, බෙදීම වැනි) සඳහා පරිගණකයක් බ්‍රිතාන්‍යයන් ලංකාවේ භාවිත කර තිබෙනවා. පළමු පරිගණකය බ්‍රිතාන්‍යය ඉන්ජිනේරු සමාගමක් වන වෝකර් පුත්‍ර සමාගම භාවිත කර ඇති බව යි වාර්තා වන්නේ. රාජ්‍යය ඉංජිනේරු සංස්ථාව, ශ්‍රී ලංකා මහා බැංකුව, රක්ෂණ සංස්ථාව, ඛනිජ තෙල් සංස්ථාව ඇතුළු සමාගම් ගණනාවක් මේ සඳහා එක්වන්නේත් 60 දශකයේදී ම යි. ප්‍රථම වරට පරිගණකය භාවිතයට ගත් අධ්‍යාපන ආයතනය වන්නේ පේරාදෙණි ඉංජිනේරු පීඨය යි. ඒ 1971 වසරේදී. පරිගණක උපාධි පාඨමාලාවක් මොරටුව ඉංජිනේරු පීඨයෙන් ආරම්භ වන්නේ 1986 වසරේදී. කෙසේ වෙතත් රාජ්‍ය අංශයේ කටයුතු සඳහා මෙන්ම ග්‍රාමීය මට්ටම දක්වා තොරතුරු සන්නිවේදන තාක්ෂණය ගෙනයෑමේ අවශ්‍යතාව 1982 වසරේ පමණ සිට හඳුනාගෙන තිබෙනවා.

1984 අංක 10 දරන පාර්ලිමේන්තු පනතකින් CINTEC ආයතනය බිහිවෙන්නේ එහි ප්‍රතිඵලයක් ලෙස යි. පෞද්ගලික හා රාජ්‍ය අංශයේ සමාජ

**ජනතාව ඩිජිටල් තාක්ෂණයෙන් සවිබල ගැන්වීම සහ ඩිජිටල් ආර්ථිකයකට අවශ්‍ය උපාය මාර්ග ක්‍රියාවලියක අවශ්‍යතාව මූලික කාර්යයන් ලෙස යි ඔවුන් හඳුනාගෙන තිබෙන්නේ. එමෙන්ම ජාතික ආරක්ෂාව, පුරවැසි සේවා, ව්‍යාපාර සේවා, රාජ්‍ය වියදම අවම කිරීම, රාජ්‍ය ආදායම ඉපයීම, රාජ්‍ය සේවයේ විනිවිදභාවය හා වගවීම තහවුරු කිරීම ප්‍රමුඛ අරමුණු ලෙස මෙහිදී හඳුනාගෙන තිබෙනවා.**

ආර්ථික දියුණුව සඳහා සංවිධාන ව්‍යුහයක් ලෙසින් දිරිගැන්වීම හා උපදේශනය මෙන් ම අවශ්‍ය පාලන කටයුතුත් මෙමඟින් සිදු කිරීම අපේක්ෂාව වී තිබුණා.

මේ ගමන් මගේ ඉතා වැදගත් සන්ධිස්ථානයක් වන්නේ 2003 අංක 27 දරන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පනත යටතේ පිහිටවනු ලැබූ ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය යි. එමඟින් ඩිජිටල් සම්බන්ධ රජයේ ප්‍රතිපත්ති හා ක්‍රියාකාරි සැලැස්ම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සියලු ම ක්‍රියාමාර්ග ගැනීමට නියම කර තිබෙනවා.

2003 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) පනතේ 6 වැනි වගන්තියට අනුව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ජාතික ප්‍රතිපත්තිය පිළියෙල කිරීමේදී ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය අමාත්‍ය මණ්ඩලයට සහාය විය යුතු බවත් එය සකස් කිරීම සඳහා අවශ්‍ය සියලු තොරතුරු සැපයිය යුතු බවත් සඳහන්.

සියලු පුරවැසියන් සඳහා ප්‍රතිලාභ සලසන ඩිජිටල් ශ්‍රී ලංකාවක් මෙහි දැක්ම වන අතර ඩිජිටල් තාක්ෂණයෙන් සවිබල ගැන්වුණු පුරවැසියන්ගෙන් හෙබි නිර්මාණාත්මක දැනුම් සමාජයක් වෙත ශ්‍රී ලංකාව පරිවර්තනය කිරීම මෙහි මෙහෙවර යි.

මේ අනුව එදා මෙදා තුර තොරතුරු සන්නිවේදන ක්ෂේත්‍රයේ ඩිජිටල් සමාජ සංවර්ධන භාවිතාව සඳහා ඉමහත් මෙහෙයක් මේ ආයතනයෙන් සිදුවී තිබෙනවා. 2004.12.16 වැනි දින කැබිනට් අනුමැතිය ලැබූ ඉ- රාජ්‍ය ප්‍රතිපත්තිය එසේත් නොමැතිනම් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ප්‍රතිපත්තිය රටක අංකික බෙදුම (DIGITAL DIVIDE)

අවම කිරීමට ඉවහල් වන සේ ඉදිරිපත් කළ වැදගත් ම ක්‍රියාවලියක්. දැනුම කේන්ද්‍රීය ආර්ථිකයක් රට තුළ නිර්මාණය කිරීම මෙහි අරමුණ යි. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ප්‍රතිපත්ති, ආයෝජන සහ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සංවර්ධනය, ඒ සඳහා වන ආයතන සවිබල ගැන්වීම මෙන් ම තොරතුරු තාක්ෂණ සාක්ෂරතාව පුළුල් ලෙස ඉහළ නැංවීමට අවශ්‍ය අධ්‍යාපන අවස්ථා විවෘත කිරීම ද මීට ඇතුළත්. රාජ්‍ය අංශය තොරතුරු තාක්ෂණයෙන් සවිබල ගැන්වීම ද සිවිල් සමාජය තොරතුරු තාක්ෂණයෙන් පිරිපුන් සමාජයක් බවට පත්කිරීම ද එහි අනෙකුත් වැදගත් අංශ වන අතර පෞද්ගලික අංශයේ තොරතුරු තාක්ෂණ සාක්ෂරතාව ඉහළ නැංවීම ද අපේක්ෂිත යි. මේ අනුව වඩාත් සුනම්‍ය රාජ්‍ය සේවයකට අවශ්‍ය ඩිජිටල් තාක්ෂණ යෙදවුම් ව්‍යාපෘති රැසක් මේ වන විටත් ක්‍රියාත්මක යි. රාජ්‍ය ආයතන අතර තොරතුරු හුවමාරු කර ගැනීමේ රාජ්‍ය ජාලය (Lanka Government Network) පොදු ස්ථාන හා තැපැල් කාර්යාල මුල් කර ගෙන ෆයිබර් හා වයිෆයි පහසුකම් සැපයීම තොරතුරු තාක්ෂණය ජනගත කිරීමක්. එමෙන් ම ශ්‍රී ලංකා රජයට අයත් ලංකා රාජ්‍ය මේඝය (Lanka Government Cloud) දත්ත හා



# ජාතික දත්ත හඳුනාගැනීමේ අන්තර් ක්‍රියාකාරී වේදිකාවක්

**ජයන්ත ද සිල්වා**
සභාපති
ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය

රජයේ ඉදිරි දැක්ම තාක්ෂණය මත පදනම් වන සමාජයක් ගොඩනැඟීම යි. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය මගින් සිදු කරන්නේ මේ වන විට ආරම්භ කර ඇති ව්‍යාපෘති දියත් කිරීම සහ නව ව්‍යාපෘති වෙනස් මුහුණුවරකින් ක්‍රියාත්මක කිරීම. මේ සඳහා රටේ ඉහළ අංශවලින් ලැබෙන ආශිර්වාදය ප්‍රශංසනීය යි. විශේෂයෙන් ම මේ කර්තව්‍යයේදී තාක්ෂණික පසුබිමක් සහිත විද්වතුන්ගෙන් සමන්විත නව කමිටුවක් පත්කිරීම නිසා වඩා කාර්යක්ෂම ව හා ඵලදායිව කටයුතු සිදුකිරීමට ලැබීම විශේෂත්වයක්. එමෙන් ම සියලු අංශ මේ සඳහා දක්වන්නේ ඉහළ සහයෝගයක්.

මේ තාක්ෂණික විප්ලවයේ ප්‍රධාන ධාරාවක් වන ඩිජිටල් රාජ්‍ය ඔස්සේ අප අවධානය යොමු කරන්නේ මහජනතාවට තාක්ෂණය මගින් ඵලදායී සේවයක් සැපයිය යුත්තේ කෙසේ ද යන්න පිළිබඳව යි. එහිදී රාජ්‍ය අංශ අතර අන්තර් ක්‍රියාකාරිත්වය ඇති කිරීම ඔස්සේ ජනතාවට රාජ්‍ය යාන්ත්‍රණය දිස් විය යුත්තේ එක් අංශයක් ලෙස. ඩිජිටල් ආර්ථිකය තුළ අවධානය යොමු කරන්නේ ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකාවේ කර්මාන්ත ජාලය පිළිබඳව යි.

මේ වැඩපිළිවෙළ තුළදී තාක්ෂණික ව්‍යාප්තකරණය (Technical Diffusion) යන්න අවධානයට ලක්වන ප්‍රධාන කාරණයක්. එනම් මෙමගින් බලාපොරොත්තු වන්නේ සියලු ක්ෂේත්‍රවල ඩිජිටල් තාක්ෂණය ඵලදායී ව උපයෝගී කරගනිමින් ජනතාවගේ දෛනික කටයුතු පහසු කිරීම යි. නිදසුනක් ලෙස කෘෂිකාර්මික කටයුතුවලදී ඩ්‍රෝන කැමරාවක් උපයෝගී කරගනිමින් සිදු කළ හැකි ක්‍රියාවලිය දැක්විය හැකි ය. ඒ අනුව කෘෂි උවදුරු පවතින කලාප, පොහොර යෙදිය යුතු සීමාව, රෝග වැළඳී ඇති බෝග ආදිය නිවැරදි ව හඳුනාගනිමින් එයට පිළියම් යෙදීම වැනි දෑ ඩ්‍රෝන කැමරා තාක්ෂණය උපයෝගී කරගනිමින් වඩා ඵලදායී ව සිදු කළ හැකි යි. මේ ක්‍රියාවලියේදී ජනතාවට තාක්ෂණය තමා අභියස දිස් වන්නේ නොමැති වුවත් ඔවුන්ගේ අපේක්ෂා ඉටු වීම සිදු වනවා. කෘෂිකර්මාන්තයට පමණක් නොව සෞඛ්‍ය, අධ්‍යාපන ආදී ක්ෂේත්‍ර ගණනාවක් සඳහා මේ තාක්ෂණය භාවිතා කළ හැකි යි. ඒ අනුව තාක්ෂණය මිනිසා සඳහා (Technology for Citizens) යන්න යි මෙහිදී අවධාරණය කරන්නේ.

උප්පැන්න සහතිකය, ජාතික හැඳුනුම්පත, විවාහ සහතික පත්‍රය, විදේශ ගමන් බලපත්‍රය ආදියෙන් මිනිසා වටා අද්‍යතනයේ නිර්මාණය වී ඇත්තේ දත්ත ගෝලයක්. ඒ අනුව මේ සියලු දත්ත පොදුවේ හඳුනාගැනීමට කිසියම් විධිමත් ක්‍රමයක් තිබිය යුතු යි. ඉදිරියේදී ඒ සඳහා විද්‍යුත් අංකයක් (Electronic ID Number) ලබාදීමට යි කටයුතු සම්පාදනය කරන්නේ. මේ අංකය භාවිතයෙන් පුද්ගලයකුගේ ක්‍රියාකාරී දත්ත සියල්ල හඳුනාගත හැකි යි. ඒ අනුව රාජ්‍ය අංශයෙන් ජනතාවට ලබාදෙන සේවා අනාගතයේදී වඩාත් කාර්යක්ෂම වනු ඇති. එමෙන් ම මේ ඔස්සේ ජාතික දත්ත හඳුනාගැනීමේ අන්තර් ක්‍රියාකාරී වේදිකාවක් (National data identify interoperability Platform) නිර්මාණය වීම ද විශේෂත්වයක්. මෙමගින් ප්‍රවාහන, අධ්‍යාපන, සෞඛ්‍ය ආදී සියලු රාජ්‍ය

තොරතුරුවල සුරක්ෂිත බව තහවුරු කරන ලද්දක්. එය තවදුරටත් තහවුරු කරමින් අන්තර්ජාල සයිබර් අවකාශය සම්බන්ධ ප්‍රබල නීති පද්ධතියක් ද ශ්‍රී ලංකාව සතු යි. රාජ්‍ය ආයතන සඳහා ඩිජිටල් ලේඛන කළමනාකරණ පද්ධති ක්‍රියාත්මක කිරීමේ වැඩපිළිවෙළ යටතේ රාජ්‍ය ආයතන විස්සකට වඩා වැඩි ප්‍රමාණයක දත්ත ඇතුළත් කිරීම මේ වන විට සිදු වෙමින් පවතිනවා. දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවේ ඒකාබද්ධ ආදායම් එකතු කිරීමේ පද්ධතිය ජාතික ආර්ථිකයට සෘජු සබඳතා ඇති ඩිජිටල් ව්‍යාපෘතියක්. ඩිජිටල් සෞඛ්‍යය ව්‍යාපෘතිය යටතේ රජයේ රෝහල් අටක් සක්‍රිය වී තිබෙනවා. ඒ අනුව රෝහලට පැමිණෙන රෝගියකුට ඉක්මන්, වඩාත් සුනම්‍ය සේවාවක් ලබා ගැනීමටත් නොමිලේ ලැබෙන ඉ- චැනලින් සේවාවකින් කාලය කළමණාකරණය කර ගැනීමටත් හැකි යි. ඉ-උරුමය ව්‍යාපෘතිය යටතේ ඩිජිටල් උරුමය ජංගම යෙදවුම් සහ වෙබ් අන්තර්ගත කළමනාකරණ ක්‍රියාවලිය මඟින් ඓතිහාසික උරුමය පිළිබඳ නිවැරදි තොරතුරු ඉතා පහසුවෙන් සංචාරකයන්ට ලබා ගත හැකි යි. දැනුම් සමාජයකට ඩිජිටල් පුස්තකාල සේවාව, ඉ - වාහන ආදායම් බලපත්‍ර අන්තර්ජාල සේවාව වැනි සෘජු පාරිභෝගික සේවාවන් විශාල ප්‍රමාණයක් මේ වන විට ක්‍රියාත්මක ව පවතිනවා.

එමෙන් ම පුරවැසියන් සමඟ සෘජු ව ම සම්බන්ධ වෙමින් ඔවුන්ගේ සේවා කටයුතු එක් තලයකට ගෙන ඒම යි සිදු වන්නේ.

මෙහිදී කිසියම් ප්‍රධාන ව්‍යාපෘතියක් උප ව්‍යාපෘති කිහිපයකට වෙන් කර නිලධාරීන්ගේ දක්ෂතා පරිදි වගකීම් පැවරීමක් සිදු වෙනවා. මෙවැනි ව්‍යාපෘති දියත් කිරීමේදී ව්‍යාපෘති කළමණාකරුවන්ගේ දායකත්වය අවශ්‍ය වන්නේ ව්‍යාපෘතිය හසුරවන්නේ කුමන අයුරින් ද? එය ඉදිරිපත් කරන්නේ කෙසේ ද? ජනතාවගේ අවධානය ලබා ගන්නේ කෙසේ ද? ආදිය පිළිබඳ අවබෝධයක් ඔවුන් සතු නිසා. කෙසේ වෙතත් ශ්‍රී ලංකාවේ මේ විෂය සම්බන්ධ ව සිදු කරන ව්‍යාපෘතිවලදී බොහෝ විට සිදු වන්නේ ව්‍යාපෘති මෙහෙයුම් බෙදා හැරීමේ මාර්ගය නොඑසේ නම් සමාජගත කිරීමේ මාර්ගය ශක්තිමත් නොවීම යි.

ශ්‍රී ලංකාවේ දෛනික ව උප්පැන්න සහතික ලබා ගැනීම, ජාතික හැඳුනුම්පත් ලබා ගැනීම, විදෙස් ගමන් බලපත්‍ර ලබා ගැනීම ආදී රජයේ සේවා ලබා ගන්නා පිරිස මිලියන 11ක් පමණ. ඒ සියලු සේවා තාක්ෂණය භාවිතා කර සිදු කළ හැකි නම් එය ඉතා වැදගත්. බොහෝ විට අප අවධානය යොමු කරන්නේ 18%ක් වන නාගරික ජනගහනයේ අවශ්‍යතා පිළිබඳ ව පමණ යි. 82%ක් වන ග්‍රාමීය ජනතාවගේ අවශ්‍යතා සඳහා ලබාදෙන ප්‍රමුඛත්වය අවම මට්ටමක යි පවතින්නේ. කෙසේ වෙතත් තාක්ෂණය සියලු දෙනාට පොදු අංගයක් විය යුතු යි. රටේ නායකත්වය මේ ව්‍යාපෘති මඟින් නිරන්තර අවධානයට ලක් කරන්නේ සාමාන්‍ය පොදු මහජනතාවගේ අවශ්‍යතාවලට සරිලන පරිදි සියලු කටයුතු සිදු විය යුතු බවට යි.

විශේෂයෙන් ම අප ධනවත් රටක් නොවන නිසා අවශ්‍යතාවේ ස්වභාවය අනුව ප්‍රමුඛත්වය ලබාදෙමින් මේ සියලු ව්‍යාපෘති දියත් විය යුතු යි. මේ නව වැඩපිළිවෙළ ඔස්සේ වර්තමානයේ නිවැරදි මාවතක අප ගමන් කරනවා. අප මේ සියලු කර්තව්‍යය සිදු කරන්නේ කිසිදු ලාබ අපේක්ෂාවකින් තොරව රට ගොඩනැගීමේ උදර අරමුණ පෙරදැරි ව යි. ඒ අනුව මේ වන විට මේ ව්‍යාපෘති සඳහා ස්වේච්ඡා සහයෝගය ලබා දීමට ද බොහෝ පිරිසක් සිටින්නේ අපේක්ෂාවෙන්. එමෙන්ම මේ වැඩපිළිවෙළ දියත් කිරීමේදී ග්‍රාම නිලධාරියාගේ සිට ඉහළ ම රාජ්‍ය සේවකයා දක්වා පැවරෙන්නේ ඉහළ වගකීමක්. මේ නව තාක්ෂණ විප්ලවය මඟින් සියලු කටයුතු විනිවිදභාවයකින් සිදුවෙනවා සේම 25%ක රාජ්‍ය ආදයමක් ඉතිරි කර ගැනීමට හැකි වන බව යි අපේ විශ්වාසය.

සිව් වසරකින් නිම කිරීමට අපේක්ෂිත මේ දැවැන්ත තාක්ෂණික විප්ලවයේදී පළමුවෙන් ම සිදු කළ යුත්තේ ජනතාව තුළ මේ පිළිබඳ විශ්වාසය ගොඩනැංවීම යි. මේ සඳහා මාධ්‍යයට ද විශාල වගකීමක් පැවරෙන්නේ ජනතාව මේ පිළිබඳ ව දැනුවත් කිරීමට. ඒ අනුව ජාතික කර්තව්‍යයක් සේ සලකා අප සියලු දෙනා මේ සඳහා සහයෝගය ලබාදිය යුතු යි.

**මල්ෂි පවිත්‍රා දික්කුඹුර**


















ජීවන තත්ත්වය ඉහළට ඔසවා තැබීමට අන්තර්ජාලය හා සමාජ මාධ්‍ය අර්ථවත් ලෙස යොදා ගැනීමට ද වැඩපිළිවෙළ රැසක් ක්‍රියාත්මක ව තිබෙනවා. මෙරට අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉගෙනුම් ක්‍රියාවලිය සඳහා ඩිජිටල් තාක්ෂණය වඩාත් ඵලදායී ලෙස යොදා ගැනීම විවිධ ක්ෂේත්‍රය ඔස්සේ මේ වන විටත් ක්‍රියාවට නංවා තිබීම වැදගත්.

සුහුරු සමාජයකට ස්මාර්ට් සමාජ කව, සුහුරුලිය, නැණසල වැනි ව්‍යාපෘති සමාජගත වී තිබෙන්නේ ප්‍රාදේශීය හා ග්‍රාමීය මට්ටමින් ජනප්‍රිය වැඩසටහන් ලෙස. මෙරට ලක්ෂ 17ක් පමණ වන රාජ්‍ය සේවකයන්ගේ දැනුම කුසලතා වර්ධනය සඳහා ඉගෙනුම් සහකරුවකු වූ අන්තර්ජාල ඉගෙනුම් පද්ධතිය ගෙල්ප් (GeLP) තවත් සේවාවක්. සාම්ප්‍රදායික ඉගෙනුම් ක්‍රමවේදයෙන් බැහැරව ඉතා නිදහස් ලෙස තම දැනුමට ඇගයුමක් ලබා ගැනීමට මෙය දොරටුවක් ලෙස වැදගත් වෙනවා.

රටක ඉතාමත් වැදගත්ම අංශයක් වන කර්මාන්ත ක්ෂේත්‍රයේ සේවා ප්‍රවර්ධනයට ඩිජිටල් තාක්ෂණික

**ජාතික සංවර්ධන ක්‍රියාවලියේදී සැලසුම් යෙදවුම වඩාත් ඉක්මන් හා කාර්යක්ෂම කිරීමට අවශ්‍ය තොරතුරු පද්ධති රැසක් ඩිජිටල්කරණය කිරීම තුළින් සුහුරු ක්‍රියාවලියකට මුලපුරා තිබෙනවා. කොළඹ නගර සභාව ඩිජිටල් සිතියම් ගත කිරීම, ඉඩම් ලියාපදිංචි කිරීමේ පද්ධතිය, ව්‍යාපාර කටයුතු පහසු කිරීමේ දර්ශකය සඳහා වන අන්තර්ජාල බිහිදොර වැනි කාර්යයන් ඉන් කිහිපයක්.**

යෙදවුම්, නව මෘදුකාංග නවෝත්පාදන අවශ්‍ය සාධකයක්. ශ්‍රී ලංකාව වැනි රටවල අනාගතය ඇත්තේ මේ සේවා සැපයුම් ක්ෂේත්‍රය වර්ධනය කිරීමෙන්. වර්තමාන රජය ද වැඩි විශ්වාසයක් මේ ක්ෂේත්‍රය වෙත තබා ඇති අතර 2023 අපේක්ෂිත විදේශ විනිමය ආයෝජනය ඇමෙරිකානු ඩොලර් මිලියන 3ක්. ICTA ආයතනයෙන් එය යථාර්ථයක් කිරීමට ව්‍යාපෘති රැසක් දියත් කර තිබෙනවා. Distrup Asia, ඉ-ස්වාභිමානී සම්මාන ප්‍රදානය වැනි වැඩසටහන් මගින් නවෝත්පාදන සහ නව අදහස් අන්තර්ජාතික මට්ටමට ගෙන යෑමට අවශ්‍යමය ශක්තිය ලබා දීම එහිදී සුවිශේෂ යි.

ජාතික සංවර්ධන ක්‍රියාවලියේදී සැලසුම් යෙදවුම වඩාත් ඉක්මන් හා කාර්යක්ෂම කිරීමට අවශ්‍ය තොරතුරු පද්ධති රැසක් ඩිජිටල්කරණය කිරීම තුළින් සුහුරු ක්‍රියාවලියකට මුලපුරා තිබෙනවා. කොළඹ නගර සභාව ඩිජිටල් සිතියම් ගත කිරීම, ඉඩම් ලියාපදිංචි කිරීමේ පද්ධතිය, ව්‍යාපාර කටයුතු පහසු කිරීමේ දර්ශකය සඳහා වන අන්තර්ජාල බිහිදොර වැනි කාර්යයන් ඉන් කිහිපයක්. වඩාත් සුමට, වේගවත් මෙන්ම විනිවිදභාවයෙන් යුත් රාජ්‍ය සේවාවක් සඳහා මේ ඩිජිටල් තාක්ෂණ සහාය අත්‍යවශ්‍ය සාධකයක් බව ලෝකයේ බෝහෝ රටවල් මේ වන විට ඔප්පු කර හමාර යි. ශ්‍රී ලංකාව ද මේ ක්‍රියාවලියේ ප්‍රමුඛ රටක් ලෙස හඳුනාගෙන තිබෙනවා.

## අභියෝග

අතීත අත්දැකීම් අනුව ඩිජිටල් තාක්ෂණය මෙවැනි සේවාවක් හා බද්ධ කිරීමේ දී පොදු කරුණු කිහිපයකට ද මුහුණදීමට සිදු වෙනවා. සාම්ප්‍රදායික ක්‍රමවේදයෙන් බැහැරව තාක්ෂණික පාරිභෝගිකයකු වීමට ආකල්පමය වෙනසක්, පුහුණුවක්, අධ්‍යාපනයක් අවශ්‍ය වෙනවා. දැනටමත් ක්‍රියාත්මක බොහෝ ව්‍යාපෘති සියයට සියයක් ජනගත නොවීමට මෙය ද එක් හේතුවක්. තාක්ෂණය අත ළඟ ඇතත් එය ප්‍රයෝජනයට නොගතහොත් එහි ඇති ඵලයක් නැහැ. අප ඉදිරියේ ඇති බෝහෝ අභියෝග ජය ගැනීමටත් යහපත් සුහුරු සමාජයක් (Smart Society) බිහි කිරීමටත් ඩිජිටල් තාක්ෂණය විශාල පිටුවහලක් වන බවත් අප මෙහිදී අමතක නොකළ යුතු යි. මේ අනුව තාක්ෂණයේ වහලකු නොවී තාක්ෂණය සුබදායී ලෙස යොදා ගැනීමෙන් ලබා ගත හැකි ඵලය ඉමහත්.

# සමස්ත ක්‍රියාවලියේම ඇති කළේ වෙනසක්



**පී. වියානි ගුණතිලක**
කොමසාරිස් ජනරාල්
පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ
දෙපාර්තමේන්තුව

පුද්ගල අනන්‍යතාව තවත් පාර්ශ්වයකට තහවුරු කිරීමට මෙන් ම බහුවිධ සමාජයක ආරක්ෂක යාන්ත්‍රණය සුරක්ෂිත කරලීමට බැඳී සිටින රාජ්‍යය ආයතනයක් ලෙස පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව හැඳින්විය හැකි යි.

දෙපාර්තමේන්තුව ආරම්භ කළ යුගයේ හැඳුනුම්පත නිකුත් කරනු ලැබුවේ එකල පැවති ඉහළ ම තාක්ෂණික තත්ත්ව උපයෝගී කර ගනිමින් කඩදාසි මත පදනම් වූ ක්‍රමවේදයක් එනම්, Manual Paper Based System යොදා ගනිමිනු යි. එහෙත් කාලයත් සමඟ හැඳුනුම්පත් නිකුත් කිරීමේ මේ ක්‍රියාවලියේ විවිධ දෝෂ ඉස්මතු වන්නට වුණා. හැඳුනුම්පතේ තොරතුරු මැකී යාම, පළුදු වීම, විකෘති වීම මෙන් ම එක ම අංකය කිහිපදෙනකුට නිකුත් වීම, ව්‍යාජ හැඳුනුම්පත් භාවිතය වැඩිවීම, හැඳුනුම්පතේ තොරතුරු යාවත්කාලීන නොවීම, ජාතික භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම යන ගැටලු ඒ අතර ප්‍රධාන යි.

මේ ගැටලුවලට විසඳුමක් ලෙස යි නව තාක්ෂණය මත පදනම් ව විද්‍යුත් හැඳුනුම්පත නිකුත් කිරීමේ වැදගත්කම පිළිබඳ අවධානය යොමු වන්නේ. ඒ අනුව, විද්‍යුත් හැඳුනුම්පත් ව්‍යාපෘතිය ආරම්භ කළ අතර එහි කටයුතු ඉදිරියට සිදු කෙරෙමින් යන අතරතුර අන්තර්කාලීන විසඳුමක් වශයෙන් 2014 පෙබරවාරි 28 වැනි දින සිට පුද්ගල දත්ත පරිගණකගත කර සංරක්ෂිත ව පවත්වා ගැනීමට යි කටයුතු කළේ. එහිදී පැවති ආරක්ෂිත කාඩ්පත ම භාවිතා කරමින් සිංහල හා දෙමළ මාධ්‍යයෙන් පමණක් හැඳුනුම්පත මුද්‍රණය කර නිකුත් කිරීම ආරම්භ කළා. මේ ක්‍රමවේදයේදී ජාතික හැඳුනුම්පත ලබා ගැනීම සඳහා යොමු කරන ඉල්ලුම්පත් හා අනෙකුත් ලේඛන සියල්ල පරිලෝකනය කර දෙපාර්තමේන්තු පරිගණක දත්ත පද්ධතිය තුළ ගබඩා කිරීමේ කාර්යයක් ආරම්භ කළා. දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයට ද අවශ්‍ය පුහුණුවීම් හා වැඩමුළු පවත්වා ඉල්ලුම් පත්‍රයේ තොරතුරු පරිගණකගත කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීමත් එහිදී අප සිදු කළ කාර්යයන්.

හැඳුනුම්පත් නිකුත් කිරීමේ ක්‍රමවේදයේ තවදුරටත් පැවති ගැටලු විසඳා ගැනීමේ අරමුණෙනු යි ජාතික හැඳුනුම්පතේ ගමන් මග සුවිශේෂී වෙනසකට ලක් කළේ. ඒ අනුව පැවති හැඳුනුම්පතේ ස්වභාවය සම්පූර්ණයෙන් ම වෙනස් කර නව ලොවට ගැළපෙන තාක්ෂණික හැඳුනුම්පතක් ලෙස නව ස්මාර්ට් හැඳුනුම්පත නිකුත් කිරීම ආරම්භ කළේ 2017 වසරේදී.

ඉලක්කම් දොළහකින් යුතු හැඳුනුම්පත් අංකයකින් මෙන් ම ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයේ (International Civil Aviation Organization - ICAO) ප්‍රමිතියෙන් යුතු ඡායාරූපයකින් සහ යන්ත්‍රානුසාරයෙන් කියවිය හැකි (Machine Readable) තීරු සංකේත (Barcode) ක්‍රමයකින් සමන්විත වීම නිස යි මේ හැඳුනුම්පත සුවිශේෂ වන්නේ. ජාත්‍යන්තර ව පිළිගත් ප්‍රමිතිවලට අනුකූල ව සුහුරු කාඩ්පතක මුද්‍රණය කරන මේ නව ජාතික හැඳුනුම්පත මඟින් මහජනතාවට මෙන් ම සේවා සපයන ආයතනවලට ද සිය කටයුතු ඉතා පහසුවෙන් හා කඩිනමින් ඉටු කර ගැනීමට පවතින්නේ ඉහළ හැකියාවක්.

අපගේ මූලික අරමුණ වන්නේ ජාතික හැඳුනුම්පත සඳහා ඉල්ලුම් කරන ඕනෑ ම පුරවැසියකුට ඉතාමත් කෙටි හා නිශ්චිත කාල සීමාවකදී හැඳුනුම්පත නිකුත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම. ඒ සඳහා මේ වන විට හැඳුනුම්පත් නිකුත් කිරීමේ මධ්‍යගත වූ ක්‍රියාවලිය විමධ්‍යගත කර තිබීම විශේෂත්වයක්. මේ වන විට බත්තරමුල්ලේ පිහිටි පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය, පළාත් කාර්යාල හා ප්‍රාදේශීය ශාඛා කාර්යාල සියල්ල ම VPN තාක්ෂණය ඔස්සේ එකම දත්ත පද්ධතියකට සම්බන්ධ කර අවසන්. ඒ නිසා හැඳුනුම්පතක් ලබා ගැනීමට ඉල්ලුම්පතක් යොමු කළ ඕනෑ ම පුද්ගලයකුට තමන් අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට යොමු වී එම ඉල්ලුම්පත මේ වන විට හැඳුනුම්පත් සැකසීමේ ක්‍රියාවලිය තුළ කුමන අදියරය යටතේ පවතින්නේ දැයි විමසා දැනගැනීමේ හැකියාව පවතිනවා. ඒ වගේ ම පළාත් කාර්යාල පිහිටුවීමේ වැඩපිළිවෙළ යටතේ දකුණු පළාත් කාර්යාලය තුළ ක්‍රියාත්මක එක්දින සේවාව තුළින් දිවයිනේ ඕනෑ ම ප්‍රදේශයක පදිංචි ඉල්ලුම්කරුවකුට තම හැඳුනුම්පත ලබා ගැනීමේ හැකියාව ද පවතිනවා.

මේ අනුව නව තාක්ෂණය සමඟ මුසු වෙමින් හැඳුනුම්පතේ භෞතික ස්වභාවය මෙන් ම හැඳුනුම්පත් නිකුත් කිරීමේ සමස්ත ක්‍රියාවලියේ ම සිදු කර ඇති සුවිශේෂී වෙනස්කම් හේතුවෙන් ශ්‍රී ලාංකික පුද්ගල අනන්‍යතාව වඩාත් නිවැරදි ව හා විශ්වසනීය ව තහවුරු කිරීමේ හැකියාවක් පවතිනවා.

**තුසිතා ධනුසේකර**



# ඩිජිටල් සංවර්ධනය සංස්කෘතියක්, පරිසර පද්ධතියක්



**මහින්ද බී. හේරත්**
ප්‍රධාන විධායක නිලධාරි
ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය

ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය ලෙස අපට ඇති මූලික වගකීමක් වන්නේ මෙරට ඩිජිටල් සංවර්ධනයක් (Digital Transformation) ඇති කිරීම. ආර්ථික විද්‍යාඥයන්ගේ අදහස වන්නේ ඩිජිටල් සංවර්ධනය දෛනික ජීවිතයේ සක්‍රීය ව භාවිතාවන්නක් (General Purpose Technology) බවට පත්ව ඇති බව යි. එනම් එය සමාජයේ සෑම ස්ථරයකට ම අවශ්‍ය වන සාමාන්‍යකරණය වූ අංගයක් බවට පත්වන බව යි. ඒ අනුව ඩිජිටල් සංවර්ධනය දෛනික ජීවිතයේ සක්‍රීය ව භාවිතාවන්නක් බවට පත්වීමට නම් එය පොදු මහජනතාවගේ අවශ්‍යතාවලට සරිලන පරිදි සකස් විය යුතු යි.

මේ සංවර්ධන වැඩපිළිවෙළ සිදු කිරීමට බලාපොරොත්තු වන්නේ මූලික වශයෙන් ම අංශ 03ක් ඔස්සේ. ඒ ඩිජිටල් ආර්ථිකය (Digital Economy), ඩිජිටල් රාජ්‍ය (Digital Government), හා ඩිජිටල් සමාජය (Digital Society) ලෙස. ඩිජිටල් ආර්ථිකය තුළ මූලික වශයෙන් ම අවධානය යොමු වන්නේ දැනට පවතින කර්මාන්තශාලා සඳහා සහ අලුතින් නිර්මාණය වන කර්මාන්තශාලා සඳහා ඩිජිටල් තාක්ෂණය හඳුන්වාදීම. නිෂ්පාදනය ඉහළ නැංවීම, ඵලදායිතාව වැඩි කිරීම සහ නව ආදායම් නිර්මාණය මෙහි මූලික අපේක්ෂාව යි. විශේෂයෙන් ම ICTA ඔස්සේ කර්මාන්තශාලා නඟා සිටුවීම සඳහා විවිධ ව්‍යාපෘති දියත් කරනවා. මේ වන විට ලංකාවේ අලුතින් ආරම්භ කළ 330ක් පමණ වන සමාගම් (Start up Companies) අතරින් 70ක ප්‍රමාණයක් ICTA ව්‍යාපෘති මඟින් ප්‍රගතියක් ලැබූ ආයතන. SriLanka go Digital, Spiralation එවැනි වැඩසටහන් කිහිපයක්. එමෙන් ම නව නිපැයුම් සඳහා ඇගයීමක් ලබාදීම පිණිස 'ඉ ස්වාභිමානී' ලෙස සම්මාන උත්සවයක් ද පවත්වනවා.

ඩිජිටල් රාජ්‍ය (Digital Government) මඟින් බලාපොරොත්තු වන්නේ සියලු රාජ්‍ය සේවා අන්තර්ජාලය ඔස්සේ සිදුකරගැනීමට පහසුකම් සැලසීම. මේ වන විටත් රජයේ විවිධ සේවා තාක්ෂණය සමඟ බද්ධ ව ක්‍රියාත්මක වුවත් මේ සේවා සියල්ල පොදු වේදිකාවකට පැමිණ නැහැ. රජයේ දැනට ක්‍රියාත්මක විද්‍යුත් හැඳුනුම්පත් ලබාදීම, විද්‍යුත් ආදායම් බලපත්‍ර ලබාදීම, ඉ - ටිකට්පත් සේවා වැනි අංශ පවතින්නේ එකිනෙකට වියුක්ත සේවා ලෙසින්. එහෙත් ඩිජිටල් රාජ්‍ය මඟින් සිදු වන්නේ මේ සඳහා පොදු වේදිකාවක් සැකසීම යි. මේ සියල්ල ඒකාබද්ධ සේවාවක් ලෙස ජනතාවට ලබා දෙන්නේ කෙසේ ද යන්න පිළිබඳ ව අධ්‍යයනය කෙරෙමින් පවතිනවා. විශේෂයෙන් ම ලෝකයේ රටවල් මේ පිළිබඳ පුළුල් අධ්‍යයනයක් සහිතව යි මේ ක්‍රියාවලිය සිදු කරන්නේ. මේ කාර්යයේදී අප සිදු කළ යුත්තේ කුමක් ද යන්න පිළිබඳ ව අවබෝධයක් අපට තිබිය යුතු යි. සැලැස්ම සැකසීමේදී අවශ්‍ය අවස්ථාවලදී දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති ද සම්බන්ධ කරගත හැකි යි.

එමෙන් ම මෙහි වටිනාකම සහ අවශ්‍යතාව පිළිබඳ ව ජනතාවට මූලික අවබෝධයක් ලබා දිය යුතු යි. ශ්‍රී ලංකාවේ 60%ක පමණ පිරිසක් ජීවත් වන්නේ ග්‍රාමීය ප්‍රදේශවල. ඒ අනුව ඔවුන්ගේ දෛනික ජීවිතයේ කටයුතු සඳහා පහසුවක් වන ලෙස මේ සංවර්ධනය සිදු විය යුතු යි. නිදසුනක් ලෙස ගොවියකුගේ අස්වැන්න වෙළෙඳපොළ වෙත නිකුත් කිරීමේදී වඩාත් උචිත ප්‍රදේශය කුමක්ද, කාලගුණ තත්ත්වය කෙසේ ද, පවතින මිල මට්ටම කෙසේ ද යන කාරණා පිළිබඳ ව තාක්ෂණය ඔස්සේ සහයෝගය සැපයීමට හැකි විය යුතු යි. ඒ අනුව එදිනෙදා ජීවිතයට බලපෑම් කළ හැකි මෘදුකාංග (Application) ඔස්සේ යි මෙය ආරම්භ කළ යුත්තේ. ඉන්දියාව මෙය ඉතා සාර්ථක ව සිදු කරන රටක්.

ඒ අනුව මෙහිදී සිදු වන්නේ රජය සමඟ ජනතාව ඒකාබද්ධ කිරීම යි. එවිට මහජන දිනයක් ලෙස එක් දිනයක් වෙන්

කිරීමේ අවශ්‍යතාව අහෝසි වන්නේ මේ ක්‍රියාවලිය මඟින් සෑම දිනයක් ම මහජන දිනයක් බවට පත් වන බැවින්.

ඩිජිටල් සංවර්ධනයේදී තවත් වැදගත් අංශයක් වන්නේ ඩිජිටල් සමාජය (Digital Society) යි. ඔවුන් මේ සඳහා අනුගත කිරීමත් (Adoption) සේවා ලැබීමේ පහසුකම ඇති කිරීමත් කළ යුතු යි. ඒ අනුව ජංගම දුරකතනයක් හෝ බ්‍රෝඩ්බෑන්ඩ් සබඳතාවක් හෝ ප්‍රාදේශීය වශයෙන් එම පහසුකම් ලබාගත හැකි නැණසල වැනි මධ්‍යස්ථානයක් හෝ ඇති කළ යුතු යි. එවිට මේ නව වෙනසට අනුගත වීම සඳහා ජනතාවට ඇති වන්නේ පෙළඹවීමක්. විශේෂයෙන් ම ළමා සහ තරුණ පරම්පරාව තුළ මේ සඳහා පෙළඹවීමක් ඇති කරවීම තාක්ෂණය නිවසට රැගෙන යාමේ උපක්‍රමයක්.

මෙහිදී ඩිජිටල් සාක්ෂරතාව (Digital Literacy) යන්න අවධානය යොමු කළ යුතු මූලික කරුණක්. ලංකාවේ බහුතර පිරිසක් තාක්ෂණය ඇසුරු කිරීමට දක්වන්නේ යම් මන්දගාමීත්වයක්. මේ නිසා ICTA මඟින් නැණසල, සුහුරු සමාජ කව (Smart Social Circle) වැනි වැඩසටහන් ඔස්සේ ග්‍රාමීය ප්‍රදේශවල ජනතාවට තොරතුරු තාක්ෂණය හැදෑරීම සඳහා අත්වැලක් සපයනවා. එමෙන් ම නව තාක්ෂණික උපාංග භාවිතයේදී යොදා ගන්නා භාෂාව පිළිබඳව ද අවධානය යොමු කළ යුතු යි. විශේෂයෙන් ම දකුණු කොරියාව, ජපානය වැනි රටවල් ඩිජිටල් සාක්ෂරතාවෙන් පෙරට පැමිණ තිබෙන්නේ වෙබ් අන්තර්ගතය (web content) සඳහා දේශීය භාෂාව භාවිතා කිරීමෙන්. ශ්‍රී ලංකාවේ සිදුවන ඩිජිටල් සංවර්ධන ක්‍රියාදාමය තුළදී ද අප මෙය සාර්ථක කිරීමට ප්‍රයත්න දරන්නේ මේ සඳහා සංකේත සහ රූප භාෂාව බහුල ලෙස යොද ගැනීමෙන්.

ඉහත සඳහන් කළ ප්‍රධාන අංශ ත්‍රිත්වයේ සාර්ථකත්වය සඳහා කාරණා කීපයක් බලපානවා. මින් පළමුවැන්න වන්නේ හැකියාව (Talent) යන්න යි. ශ්‍රී ලංකාවේ පවතින තත්ත්වය වන්නේ මේ විෂය සඳහා පුහුණු කරන ලද නිලධාරීන් එයින් ඉවත් ව ගිය පසු එම ව්‍යාපෘතිය ඇනහිටීම යි. එම නිසා ශ්‍රී ලංකාව තුළ සිංගප්පූරුවේ මෙන් ජාතික ඩිජිටල් සේවයක් (National Digital Service) ස්ථාපිත කළ යුතු යි. එවිට යි මේ ක්‍රියාදාමය අඛණ්ඩ ව ඉදිරියට ගෙන යා හැකි වන්නේ.

දෙවැනි කාරණය වන්නේ මේ සඳහා පර්යේෂණ සිදු කිරීම. එය ඩිජිටල් සංවර්ධන ක්‍රියාවලිය සමාජයට සේවයක් වීම පිණිස සිදු කරන සමාජ විද්‍යා පර්යේෂණ විය යුතු යි. ඒ අනුව ලොව අනෙකුත් රටවල් මෙය සිදු කළ ආකාරය, ඩිජිටල් සංවර්ධනය සීඝ්‍රයෙන් සිදු වූ රටක් ලෙස අප්‍රිකාව වැනි රටවල් මෙයට අනුගත වූ ආකාරය, ලංකාවේ සාක්ෂරතා මට්ටම අනුව සිදු කළ යුත්තේ කුමක් ද? වැනි කාරණා පිළිබඳව යි පර්යේෂණ සිදු විය යුත්තේ. මේ සියල්ල සාර්ථක කරගැනීම සඳහා යටිතල පහසුකම් සංවර්ධනය ද අත්‍යවශ්‍ය සාධකයක්. මෙය සාර්ථක කරගැනීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය ද ඉතා වැදගත්. විශේෂයෙන් ම රටේ ඉහළ ම තලයෙන් මේ සඳහා අනුග්‍රහය ලැබෙන ප්‍රථම අවස්ථාව ලෙස ICTA ආයතනයට මේ ජාතික කර්තව්‍යය සාර්ථක කරගැනීම සඳහා ඇත්තේ විශාල වගකීමක්.

ඩිජිටල් සංවර්ධනය යනුවෙන් අප නිර්මාණය කරන්නේ පරිසර පද්ධතියක් (Eco systam). මේ පරිසර පද්ධතියට ඩිජිටල් බීජයක් ඇතුළත් කර ගසක් නිර්මාණය කරනවා. මේ ආකාරයෙන් නිර්මාණය වන පරිසර පද්ධතියක් ලෙසට යි ඩිජිටල් සංවර්ධන ක්‍රියාදාමය සකසන්නේ. මෙහිදී තාක්ෂණය යන්න එක් අංශයක් පමණ යි. ඒ අනුව මේ පද්ධතිය සාර්ථක කරගැනීමට ආර්ථික, සමාජ, දේශපාලන විද්‍යාඥයන්ගේ ද සහාය අවශ්‍යය යි. ඩිජිටල් සංවර්ධනය සංස්කෘතියක් බවට පත් කරගත යුතු යි. එහිදී එය තාක්ෂණික හරඹයක් නොවන බව අවබෝධ කරගත යුතු යි. එමෙන් ම මෙය ජාතික අපේක්ෂාවක් බවට පත්කොට ඩිජිටල් සවිඥනිකත්වයෙන් හෙබි සංස්කෘතියක් නිර්මාණය කළ යුතු යි.

**මල්ෂි පවිත්‍රා දික්කුඹුර**




**සමීර ජයවර්ධන**
ප්‍රධානී
(සංවර්ධන)
තොරතුරු හා සන්නිවේදන
තාක්ෂණ නියෝජිතායතනය
sameeraj@icta.lk

පුද්ගලයාගේ දෛනික ජීවිතය ඵලදායී ව වෙනස් කිරීම සඳහා උපයෝගී කර ගන්නා මෙවලමක් ලෙසට යි ඩිජිටල් තාක්ෂණය හැඳින්විය හැකි වන්නේ. ශ්‍රී ලංකාවේ මේ තාක්ෂණය සංගෘහිත ව සියළු ක්ෂේත්‍රවල ඵලදායී ව යොදා ගැනීමේ කටයුතු ක්‍රියාත්මක වීම ආරම්භ වූයේ e-Sri Lanka මුල පිරුමත් සමඟ. ඒ 2004 වසරේ සිට. මේ සමඟ පරිගණක සාක්ෂරතාව, ඩිජිටල් තාක්ෂණ යෙදවුම්, තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම්, තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ නීති රාමුව හා ප්‍රතිපත්ති මෙන් ම ඉ-රාජ්‍ය (e-Government) සංවර්ධන කටයුතු හඳුන්වා දීම ද සිදු වුණා. මේ කර්තව්‍යය සිදු කරන ප්‍රධාන ම ආයතනය බවට පත්වන්නේ ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය යි (ICT). සංවර්ධනය සඳහා ඩිජිටල් තාක්ෂණය භාවිතය පිළිබඳ කටයුතු කිරීම යි මෙමඟින් සිදු වන්නේ. මේ යටතේ සියළු පාර්ශ්ව වෙත තොරතුරු තාක්ෂණයේ ප්‍රතිලාභ ප්‍රායෝගික ව සහ ඵලදායී ලෙස ගෙන යාම ප්‍රධාන ම කර්තව්‍යය යි. මෙහිදී






තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම, ඊට අවශ්‍ය නීති හා ප්‍රතිපත්ති සම්පාදනය, තොරතුරු තාක්ෂණ මෙවලම් නිර්මාණය ඉතා වැදගත්.

රටක ඩිජිටල් සංවර්ධනය සිදු කිරීම සඳහා සියලු පාර්ශ්ව සම්බන්ධ වූ ක්‍රියාවලියක් අවශ්‍යය යි. මෙහිදී රටේ තොරතුරු තාක්ෂණ කර්මාන්තය, ව්‍යාපාර ක්ෂේත්‍රය මෙන් ම රාජ්‍ය අංශය සහ අනෙකුත් සමාජ ක්‍රියාකාරී ආයතන වලටත් විශාල මැදිහත්වීමක් සිදු කළ යුතු වෙනවා. ඒ අනුව තොරතුරු තාක්ෂණ කර්මාන්තය ප්‍රවර්ධනයට සහ අනෙකුත් ව්‍යාපාරික ක්ෂේත්‍ර ඩිජිටල් තාක්ෂණය තුළින් ඉදිරියට ගෙනයාම සඳහා වැඩසටහන් රාශියක් අප ආයතනය මගින් සිදු කරන අතර තොරතුරු තාක්ෂණ ව්‍යවසායකයන් දිරි ගැන්වීම සඳහා ද ක්‍රියාත්මක කරන්නේ වැඩසටහන් රාශියක්. රටේ ගාමක අංශය රාජ්‍ය අංශය වන බැවින් මේ සඳහා රාජ්‍ය අංශය මෙහෙයවීම ඉතා අභියෝගාත්මක කර්තව්‍යයක්. ඉ-රාජ්‍ය සංකල්පය (e-Government) ලෙස හඳුන්වන මෙමගින් අපේක්ෂා කරන්නේ තොරතුරු තාක්ෂණය මගින් රාජ්‍ය අංශයේ ක්‍රියාවලි වඩාත් කාර්යක්ෂම ව, ඵලදායී ව සහ පුරවැසි හිතකාමී ආකාරයෙන් සිදු කිරීම යි.

මේ සඳහා අවශ්‍ය ඩිජිටල් යටිතල පහසුකම්, පද්ධති සහ අවශ්‍ය තාක්ෂණික මග පෙන්වීම ICTA ආයතනය විසින් මේ වන විටත් සිදු කරනු ලබනවා. එසේ ම බොහෝ ඩිජිටල් තාක්ෂණ ව්‍යාපෘතිවල අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීම සඳහා බලපෑම් සිදුකරන වෙනස්කම් කළමණාකරණය (Change Management), ඒ සඳහා අවශ්‍ය මානව සම්පත් ධාරිතා ප්‍රවර්ධනය (Human Resource Capacity Building) මූලෝපායික ලෙස ක්‍රියාත්මක කිරීමත් ICTA ආයතනය මගින් සිදු කරනු ලබනවා.

ඩිජිටල් සංවර්ධන ක්‍රියාවලියේ සාර්ථකත්වයට බලපාන ප්‍රධාන සාධකයක් වන්නේ එම ව්‍යාපෘතිවල ප්‍රතිලාභ, අපේක්ෂිත පාර්ශ්ව විසින් ධනාත්මක ව සහ තිරසර ව භාවිතා කිරීම යි (Digital Adoption). වර්තමානයේදී රජයෙන් සේවා ලබා ගන්නා සේවාලාභීන් පිරිස ද වයස් මට්ටම අනුව වෙනසක් පෙන්නුම් කරනවා. සමාජ විද්‍යාවට අනුව පරම්පරා වර්ගීකරණයේදී රජයේ සේවා ලබා ගන්නා බොහෝ සේවාලාභීන් පසු වන්නේ X සහ Y කාණ්ඩයේ. එනම් 1965 වසරෙන් පසු සහ 1980 වසරෙන් පසු පරම්පරාව යි. එසේම වසර 2000 න් පසු පරම්පරාව වන සහස්‍රකයේ දරුවන් ඉදිරියේදී රාජ්‍ය සේවා ලබා ගැනීම සඳහා රාජ්‍ය අංශය වෙත පිවිසෙනු ඇති. මොවුන්ගේ අවශ්‍යතා සහ අපේක්ෂිත සේවා මට්ටම් නවීන අදහස් සමගින් වෙනස් වන නිසා ඔවුන්ට උචිත සේවයක් සැපයීමට හැකි පරිදි රාජ්‍ය අංශය පරිවර්තනයකට ලක් විය යුතු යි. ඩිජිටල් සංවර්ධනයේ අපේක්ෂා ව එය යි.

රාජ්‍ය අංශය බලාත්මක කිරීම පමණක් නොව, ඩිජිටල් තාක්ෂණයේ ප්‍රතිලාභ සියළු ප්‍රජාව වෙත ගෙන යාම සඳහා විවිධ මූලෝපායික කටයුතු අප ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලබනවා. එසේම ග්‍රාමීය අංශයේ ව්‍යවසායකයන් දිරි ගැන්වීම කෙරෙහි ද අප යොමු කර ඇත්තේ ඉහළ අවධානයක්. ඒ අනුව තොරතුරු තාක්ෂණය ඵලදායී ව භාවිත කිරීම සඳහා මේ වන විට ද වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක තලයේ පවතිනවා. මේ සඳහා ඩිජිටල් සංවර්ධන ක්‍රියාවලියේදී පුරවැසියන්ට වඩාත් ඵලදායී ව ඩිජිටල් තාක්ෂණය තම එදිනෙදා කටයුතු සඳහා භාවිතා කිරීමට සැලසීමත් (Digital Literacy) ඒ හරහා ඔවුන්ගේ ජීවන මට්ටම ඉහළ නැංවීමත් අපේක්ෂිත යි.

මේ සියලු කාර්යයන්ට සමගාමී ව රටක් ලෙස ඩිජිටල් තාක්ෂණයට අදාළ මූලෝපායික ක්‍රියාමාර්ග ගැනීම සහ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම තවත් ප්‍රමුඛ කාර්යයක්. මේ ප්‍රතිපත්ති සම්පාදනය සිදු කරන්නේ තනි තනි ආයතන වශයෙන් නොව, රජයක් ලෙස යි. පරිගණක අපරාධ පනත, ඉලෙක්ට්‍රොනික ගනුදෙනු කිරීමේ පනත, බුද්ධිමය දේපල පනතෙන් ඉලෙක්ට්‍රොනික කාරණා ආවරණය කිරීම වැනි නීති පද්ධතියක් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන නිසා ආසියා පැසිපික් කලාපයේ විද්‍යුත් නීතිය (e-Law)

ශක්තිමත් රටක් ලෙස ශ්‍රී ලංකාව පත් ව තිබෙනවා. මේ සියලු කාරණා සිදු වන්නේ ICTA මැදිහත් වීමෙන් වීම සතුටට කාරණයක්.

මේ සියලු ම සංවර්ධන කටයුතු විධිමත් ලෙස නියාමනය සහ ඇගයීම අප ආයතනය විසින් අනවරත ව සිදු කරගෙන යනු ලබනවා. ඒ අනුව වඩාත් ඵලදායී ලෙස මේ කර්තව්‍යය සිදු කිරීමට අප කටයුතු කරනු ලබනවා.

ඩිජිටල් සංවර්ධනය වඩාත් සාර්ථක ව සිදු කිරීම සඳහා අභියෝග කිහිපයක් පවතිනවා. අප උත්සාහ කරන්නේ ධනාත්මක වෙනසක් සීඝ්‍ර ව සිදු කිරීමට. විශේෂයෙන් ම අවුරුදු ගණනක සිට කිසියම් රාමුවක කටයුතු කළ රාජ්‍ය ආයතන තුළ ක්ෂණික පරිවර්තනයක් සිදු කිරීම අසීරු යි. මීට අමතර ව තාක්ෂණය, ක්‍රියාවලිය, ජනතාව සහ සම්පත් ද අභියෝග ලෙස යි හැඳින්විය හැකි වන්නේ. මේ අතරින් ද වඩාත් ප්‍රබල ම අභියෝගය වන්නේ ජනතාව යි. ඔවුන් ආකල්පමය ලෙස හා චර්යාත්මක ලෙස වෙනස් කිරීම විශාල අභියෝගයක්.

කෙසේ වෙතත් මේ අභියෝග ද ජයගෙන මේ ජාතික කර්තව්‍යය සිදු කිරීම සඳහා අවශ්‍ය වන්නේ වඩා යහපත් නායකත්වයක් (e-Leadership). ඒ නායකත්වය රාජ්‍ය අංශයේ ඉහළ ස්ථරයේ සිට පහළ සේවකයා දක්වා ම තිබිය යුතු යි. එවිට යි තිරසර ප්‍රවේශයකින් යුතු ව ඩිජිටල් තාක්ෂණය ඉදිරියට ගෙන යා හැකි වන්නේ. වර්තමානයේදී රාජ්‍ය අංශය තුළ තොරතුරු තාක්ෂණයට සම්බන්ධ ව කටයුතු කරන නිලධාරීන් සහ ප්‍රධාන නව්‍යකරණ නිලධාරීන් ඩිජිටල් සංවර්ධනය කෙරෙහි දක්වන උනන්දුව මේ සඳහා ධනාත්මක පසුබිමක් සකසන බව අපගේ විශ්වාසය යි. එසේම සියළු අංශ ඩිජිටල් තාක්ෂණය ඵලදායී ව භාවිතා කිරීම (Adoption) සඳහා දක්වන උනන්දුව මේ සංවර්ධන ක්‍රියාවලිය ඉදිරියට ගෙනයාම සඳහාත් ධනාත්මක ලෙස රටේ සංවර්ධනය සුබ දිශානතියකට යොමු කිරීම සඳහාත් වැදගත් වෙනු ඇති.

**මල්ෂි පවිත්‍රා දික්කුඹුර**

# රාජ්‍ය සේවා ජාලගතවීම සාධනීය තත්ත්වයක්



**ආචාර්ය ලොචන්දක රණතුංග**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
තොරතුරු තාක්ෂණ අධ්‍යයනාංශය
මොරටුව විශ්වවිද්‍යාලය

ඩිජිටල් තාක්ෂණය ඔස්සේ ලොව බොහෝ කටයුතු සිදුවෙමින් පවතින අවධියක ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවා ඩිජිටල්කරණයට යොමුවීම සාධනීය තත්ත්වයක්. සිංගප්පූරුව, මැලේසියාව, ඉන්දියාව වැනි රටවල මේ වන විට මේ සේවා ඩිජිටල්කරණය වීමෙන් රටවල් අතර සිදු වන ගනුදෙනු පවා පහසු වී තිබෙනවා. ස්වදේශිකයකු මැලේසියාව, සිංගප්පූරුව වැනි රටකට ඇතුළු වන විටදී ම එම පුද්ගලයාගේ අනන්‍යතාව තාක්ෂණය ඔස්සේ තහවුරු කර ගත හැකි පරිදි ගුවන්තොටුපොළ සේවා ද පවතින්නේ දියුණු මට්ටමක.

ශ්‍රී ලංකාවේ මේ වන විටත් ඇතැම් රාජ්‍ය ආයතන ඩිජිටල් තාක්ෂණය භාවිතයෙන් ජනතාවට සේවා පහසුකම් සලසමින් තිබෙනවා. විශේෂයෙන් ආගමන විගමන දෙපාර්තමේන්තුව, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, ඇතැම් රෝහල් ඇතුළු තවත් ආයතන බොහොමයක් ඩිජිටල් තාක්ෂණයෙන් ඵල ලැබූ ආයතන. අනෙකුත් රාජ්‍ය ආයතනවල කටයුතු ද ඩිජිටල් තාක්ෂණ ඔස්සේ ඉටු කළ හැකි පරිදි දියුණු මට්ටමට ගෙන ඒමට ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) මඟින් කළමනාකරණ හා අධීක්ෂණ කටයුතු කිරීමට අවධානය යොමු වීම වැදගත්. එමඟින් සියලු රාජ්‍ය ආයතනවල ඩිජිටල් හා යටිතල පහසුකම් එකම ව්‍යුහයකට සංවර්ධනය කරගත හැකි වනු ඇති. වර්තමානයේ තොරතුරු තාක්ෂණ සහ සේවා සපයන විදේශ සමාගම් අතර ශ්‍රී ලංකාව ද ඉදිරියෙන් සිටිනවා. තවදුරටත් එම තත්ත්වය තහවුරුවීමට මෙලෙස අප රටේ රාජ්‍ය ආයතන ව්‍යුහය ඩිජිටල් තාක්ෂණය ඔස්සේ ඉදිරියට පැමිණීම යහපත් ආකාරයෙන් බල පෑ හැකි යි.

> **"අවශ්‍ය වන්නේ පොදු දත්ත ගබඩාවක් ස්ථාපිත කිරීමෙන් තොරතුරුවල නිරවද්‍යතාව තහවුරු කර ගැනීමට කටයුතු කිරීම යි. එවිට සේවා එක ම ස්ථානයකින් සපයාගත හැකිවීමෙන් මහජනයාට කාලය මෙන් ම වියදම ද ඉතිරි කර ගත හැකි වෙනවා. ඉන් ලැබෙන්නේ සන්නිවේදන පහසුව සහ ජනතාවට තොරතුරු ඉදිරිපත් කිරීමට තිබෙන අපහසුතා මඟහැරීම."**



ප රිගණකය අද මිනිසාට අත්‍යවශ්‍යම උපකරණයක් බවට පත් ව තිබෙනවා. මිනිසාගේ සියලු වැඩකටයුතු ඉතා පහසුවෙන් ඉටුකර ගැනීමට ඉන් ලැබෙන පිටිවහල අති විශාල යි. පරිගණකය ක්‍රියාත්මක වන්නේ එයට ලැබෙන විධාන අනුව. එහි දත්ත ගබඩාවේ ඇති විධාන අතර අතිශයින් වැදගත් විධාන තුනක් වන්නේ කැපීම (Cut), පිටපත් කිරීම (Copy) හා ඇලවීම (Paste) යන ක්‍රියාවලිය යි. පරිගණකයට මේ විධාන තුන නිර්මාණය කරන ලද්දේ ලැරී ටෙස්ලර් විසින්. ඔහු 2020 පෙබරවාරි 16 දින ලොවින් සමුගත්තා. මිය යන විට ඔහුගේ වයස අවුරුදු 74ක්.

ඇමෙරිකානු පරිගණ විද්‍යාඥයකු වූ ලෝරන්ස් ගෝර්ඩන් ටෙස්ලර් ප්‍රසිද්ධියට පත් වුණේ ඔහුගේ නව සොයාගැනීම් නිස යි. 1970 දසකයේ එවක පරිගණකය ලොවට එතරම් හුරු මෙවලමක් වූයේ නැහැ. එවක ලැරී සේවය කළේ සෙරොක්ස් පැලෝ ඇල්ටෝ පර්යේෂණ මධ්‍යස්ථානයේ. එහිදී ඔහු නව පරිගණක විධාන රැසක් පිළිබඳ පර්යේෂණවල නිරත වුණා. කැපීම, පිටපත් කිරීම සහ ඇලවීම වැනි විධානවලට අමතර

**පරිගණකය ක්‍රියාත්මක වන්නේ එයට ලැබෙන විධාන අනුව. එහි දත්ත ගබඩාවේ ඇති විධාන අතර අතිශයින් වැදගත් විධාන තුනක් වන්නේ කැපීම (Cut), පිටපත් කිරීම (Copy) හා ඇලවීම (Paste) යන ක්‍රියාවලිය යි. පරිගණකයට මේ විධාන තුන නිර්මාණය කරන ලද්දේ ලැරී ටෙස්ලර් විසින්.**

කෙසේ වෙතත් අප රටේ මේ ඩිජිටල් පහසුකම් ඒ ඒ ආයතන මට්ටමින් වර්ධනය වී තිබීම ජනතාවට පහසුවක්. එහෙත් ඒවා ජාලගත වී නොතිබීමෙන් රාජ්‍ය කටයුතුවල කාර්යක්ෂමතාව සහ නිරවද්‍යතාව ඇති නොවීමෙන් අපේක්ෂිත සහය ජනතාවට නොලැබී යා හැකි යි. එක් එක් ආයතනවල එක ම පුද්ගලයාගේ වුව ද තොරතුරු එකිනෙකට වෙනස්. ව්‍යාජ තොරතුරු ඉදිරිපත්වීමට මේ නිසා තිබෙන ඉඩකඩ වැඩියි. එ බැවින් අවශ්‍ය වන්නේ පොදු දත්ත ගබඩාවක් ස්ථාපිත කිරීමෙන් තොරතුරුවල නිරවද්‍යතාව තහවුරු කර ගැනීමට කටයුතු කිරීම යි. එවිට සේවා එක ම ස්ථානයකින් සපයාගත හැකිවීමෙන් මහජනයාට කාලය මෙන් ම වියදම ද ඉතිරි කර ගත හැකි වෙනවා. ඉන් ලැබෙන්නේ සන්නිවේදන පහසුව සහ ජනතාවට තොරතුරු ඉදිරිපත් කිරීමට තිබෙන අපහසුතා මඟහැරීම.

මෙරට බැංකු පද්ධතිය මේ වන විටත් බොහෝදුරට ඩිජිටල් තාක්ෂණය ඔස්සේ නවීකරණය වී අවසන්. බැංකු අතර ජාලකරණය නිසා පාරිභෝගික ජනතාවට ලොව කොතැනක සිටියත් තම අවශ්‍යතා ඉටු කර ගත හැකි යි. කෙසේ වෙතත් රාජ්‍ය ආයතන මට්ටමින් ගත් විට ඒවාට විවිධ අණපනත් මඟින් වගකීම් හා බලය පැවරී තිබෙන අතර ම බොහෝ තොරතුරු ආරක්ෂිත ව ගබඩා කර තැබීමයි සිදු වන්නේ. මෙහිදී පිටතට නොදිය යුතු තොරතුරු තිබෙනවා. ඩිජිටල් තාක්ෂණය ඔස්සේ ආයතන ජාලගත කිරීමේදී මේ සම්බන්ධයෙන් එකඟතාවලට පැමිණීම මෙන් ම එය අභියෝගාත්මක ද විය හැකි යි.

තොරතුරු පද්ධති විනාශ කළ හැකි ත්‍රස්ත ක්‍රියා ද මෙහි නැතුවා ම නොවෙ යි. 2017 වර්ෂයේ එංගලන්තයේ සියලු රෝහල්වල ශල්‍යකර්ම පවා එකවිට නැවතුණේ මෙවැනි ක්‍රියා නිසා තොරතුරු ජාලය බිඳ වැටීමෙන්. වරෙක යුක්‍රේනයේ බැංකු පද්ධතිය ම බිඳ වැටුණු අවස්ථා ද තිබුණා. ඩිජිටල් තාක්ෂණයේ භාවිතය වැඩිවීමත් සමඟ යි මේ පද්ධතියේ ආරක්ෂාව සම්බන්ධයෙන් ආරක්ෂණ පිළිවෙත් සහ ක්‍රියාදාම දැඩි විය යුත්තේ. යුරෝපා රටවල අසන්නට ලැබෙන සයිබර් ප්‍රහාර බහුල වී ඇත්තේ ද මේ නිසා.

කෙසේ වෙතත් ශ්‍රී ලංකාවේ තාක්ෂණ පාදක සමාජයක් ගොඩනැඟීමට ගන්නා මේ උත්සහාය පැසසිය යුත්තේ ඉන් ලැබෙන සමාජ හා ආර්ථික ඵල ද ඉහළ මට්ටමක පවතින නිසා. සංවර්ධනය කරා යන ගමනේදී මෙය අත්‍යවශ්‍ය සාධකයක්.

**මාලා මල්කාන්ති පරණගමගේ**

ජීවිතයක පිය සටහන්

# පරිගණකයට විධාන එකතු කළ විද්‍යාඥයා




ප්‍රියන්ජන් සුරේෂ් ද සිල්වා




ව සෙවීම (Search) ප්‍රතිස්ථාපනය කිරීම (Replace) වැනි විධාන ද ඔහුගේ සොයා ගැනීම්. ටෙස්ලර්ගේ එම සොයාගැනීම් නිසා පෞද්ගලික පරිගණක භාවිත කරන්නන්ට හා පරිගණකය හදරන්නන්හට විශාල පහසුවක් වුණා. මේ විධාන ඇපල් මෘදුකාංගවලට ඇතුළත් කෙරුණේ 1983 වසරේ එළිදැක් වූ ලීසා පරිගණකය සමඟ යි. 1984 වසරේදී එය මැකින්ටෝෂ් පරිගණකයටත් යොදා ගැනුණා.

ඔහුගේ නිර්මාණයක් වන ස්මෝල්ටෝක් හෙවත් ප්‍රථම ගතික වාස්තවිත ක්‍රමලේඛන භාෂාව සහ සෙරොක්ස් ඇල්ටෝ පරිගණකය සඳහා නිර්මාණය කළ ජීප්සි හෙවත් ග්‍රාෆිකාකාර අතුරු මුහුණතක් සහිත වදන් සකසනය නිසා පරිගණක තාක්ෂණය වෙනස් මඟකට යොමු වූවා.

1945 අප්‍රියෙල් 24 වැනි දින උපත ලද ටෙස්ලර් 1961 වසරේදී බ්‍රොන්ක්ස් උසස් විද්‍යා පාසලෙන් උපාධිය හිමිකර ගත්තා. 1961දී ඔහු පරිගණක විද්‍යාව හැදෑරීම සඳහා ස්ටැන්ෆෝර්ඩ් විශ්වවිද්‍යාලයට ඇතුළත් වන විට ඔහුගේ වයස අවුරුදු 16යි. පසුව ස්ටැන්ෆෝර්ඩ් කෘත්‍රිම බුද්ධි පර්යේෂණාගාරයේ සේවය කළ ඔහු එහිදී තවත් මිතුරකු සමඟ එක් ව කොම්පෙල් නමැති ආරම්භක තනි පැවරුම් භාෂාවක් (Early Single Assignment Language) නිර්මාණය කළා. මේ ක්‍රියාකාරී ක්‍රමලේඛන භාෂාව (Functional Programming Language) සමගාමී සැකසුම් වඩාත් ස්වාභාවික කිරීමට යොදාගැනුණු ලද අතර නවකයන්ට ක්‍රමලේඛන සංකල්ප හඳුන්වා දීමට භාවිතා කරනු ලැබුවා.

පසුව ඔහු සෙරොක්ස් පරිගණක සමාගමේ සේවයට එක්වුණා. ඇලන් කේ විසින් නිර්මාණය කළ අතේ ගෙන යා හැකි පරිගණක පද්ධතියක් වන සෙරොක්ස් නෝට්ටේකර් නිර්මාණය කළ කණ්ඩායමට ඔහු ද ඇතුළත් වුණා. එවකට දෘඩාංග ක්‍රමලේඛනය හා සැලසුම්කරණය පිළිබඳ නවකයකු වූ ටෙස්ලර් සමඟ ඩග්ලස් ෆෙයාර්බෙයාන් මේ සැලසුමට දයක වුණා. දෘඩාංගයේ නොව මෘදුකාංගයක ලියැවුණු පළමු ක්‍රියාකාරී ඊතර්නෙට් ප්‍රොටෝකෝලය මේ පරිගණකයට ඇතුළත් කරන්නට ඔවුනට හැකි වුණා.

ඔහුට ඇපල් සමාගමේ නිර්මාතෘ ස්ටීව් ජොබ්ස් මුණ ගැසෙන්නේ සෙරොක්ස් සමාගමේ සේවය කළ අවධියේ. 1980දී ඔහු ඇපල් සමාගම හා එක්වූවා. ඇපල් ලීසා සහ ඇපල් නිව්ටන් නමැති පරිගණක නිර්මාණයට ඔහුගේ දයකත්වය හිමිවුණා. ඔබ්ජෙක්ට් පැස්කල් හෙවත් පැස්කල් නමැති පරිගණක වැඩසටහන් භාෂාව සහ මැක් ඇප් නමැති පරිගණක නියැලුම ද ඔහුගේ නිර්මාණ. ඇපල් සමාගමේ විවිධ තනතුරු දරූ ඔහු 1998 එහි උප සභාපතිවරයා සහ ප්‍රධාන විද්‍යාඥයා බවට පත් ව සිටියා. ඇපල් සමාගමේ වසර 17ක් සේවය කළ ලැරී ඉන් ඉවත් වීමෙන් පසු කෙටි කලක් ඇමසන් හා යාහු සමාගම්වල සේවය කළ බව සඳහන්.